**ඒරාවූර් නගර සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 18 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 08 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නොවැම්බර් මාසයට අදාළ උසාවි දඩ රු.499,724 ක් ලැබිය යුතුව තිබුණත් ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නියමිත කාලය තුළදී ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ආ) | මුද්දර ගාස්තු රු.326,764 ක් ලැබිය යුතුව තිබුණද, ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නියමිත කාලය තුළදී ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ඇ) | සභාවේ යන්ත්‍ර උපකරණ 40 ක් පැවතුණත්, ඒවායේ වටිනාකම එකතුව රු.8,185,903 ක් වශයෙන් දක්වා තිබූ නමුත්, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිවැරදි වටිනාකම් හෙළිදරව් කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1.38 ක් වටිනා ට්‍රැක්ටරයක් මිලදී ගෙන තිබුණත් එය අවසන් ගිණුම්වලට ගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට ඇතුළත් දෑ එම වර්ෂයේදීම එකතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිර්දේශ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ලෙස ඉදිරියට ගෙනා රු.3,014,196 ක් නිවැරදි ලෙස හඳුනාගෙන ඒවා අදාළ අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතා ඉක්මනින් අයකර ගැනීමට පියවර ගත යුතු වීම. | අයකර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. |
| (ආ) | ගෙවිය යුතු රු.3,683,541 ක් නිවැරදි ලෙස හඳුනාගෙන ගෙවා නිරවුල් කර නොතිබුණි. | අදාළ කාලය තුළදී ගෙවා නිරවුල් කළ යුතු වීම. | ඉදිරියේදී විධිමත් අයුරින් ගෙවනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නගර සභා ආඥා පනතේ 255 වැනි පරිච්ඡේදයේ 177(2) වගන්තිය | නගර සභා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාරාංශය, ඊළඟ මාර්තු මාසයේ පළමු දිනට ප්‍රථම මහජනයාගේ දැනගැනීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතු වුවත්, සභාවේ 2017 හා 2018 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය මහජනතාවගේ දැනගැනීම සඳහා රජයේ | නියමිත කාලයේදී ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට 2019 අප්‍රේල් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.2,673,521 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.381,544 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,292,927 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් සහ රැස්කළ ආදායම් ආදායම්

සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු අනුව රු.1,575,399 ක් අයකර නොමැතිව හිඟහිටව පැවතුණි.

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්පත් රු.2,954,298 කින් රු.1,538,560 ක් පමණක් අයකරගෙන තිබුණි. ආසන්න වශයෙන් 50% ප්‍රතිශතයක බදු අයකරගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාළව හිඟහිටි ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 50% ක ප්‍රතිශතයකටත් අඩු ප්‍රමාණයක් පමණක් අයකර ගෙන තිබුණි. | ඉතා ඉක්මණින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**2.2.3 කඩ කුලී**

**-----------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ලංසු කුලී, මස් කඩ බදු, පැරණි වෙළඳපොල බදු රු.4,717,114 ක් 2012 වර්ෂයේ සිට අයකර නොමැතිව හිඟහිටවව පැවතුණි. | ඉතා ඉක්මණින් අයකරගැනීමට කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

**---------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| බලපත්‍ර ගාස්තු රු.1,629,185 ක් අයකර නොමැතිව හිඟහිටව පැවතුණි. සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ද රු.1,709,590 ක් හිඟහිටව පැවතුණි. | 2015 වර්ෂයට පෙර සිටද හිඟහිටව පවතින ශේෂ අයකිරීමට කටයුතු කළ යුතු වීම. | හිඟහිටි ප්‍රචාරණය අවම කළ හැකිය. |

**2.2.5 අනෙකුත් ආදායම්**

**---------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අනෙකුත් ආදායම් රු.2,138,308 ක් අයකර නොමැතිව හිඟහිටව පැවතුණි. | ඉතා ඉක්මණින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**2.2.6 උසාවි දඩ සහ මුද්දර ගාස්තු**

**-----------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ සියළුම නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.499,724 ක් උසාවි දඩ ගාස්තු සහ රු.326,764 ක් මුද්දර ගාස්තු වශයෙන්ද ලබාගත යුතුව තිබුණි. | නියමිත කාලයේදී අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අනාගතයේදී අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත්, සහ මහජනතාවගේ සුවය, පහසුකම් සහ සුභසාධනය සභාව විසින් ඉටුකළ යුතු යුතුකම් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) මෙහෙයුම් කාර්යසාධනයේ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| I | ආගමික ස්ථාන දෙකකට අයත් ඉඩමේ සාමාන්‍යයෙන් රු.මිලියන 193 ක වියදමින් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට 2017 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර තිබුණත්, මෙම කාර්යයන් 2019 අප්‍රේල් මාසය වන විටත් අවසන් වී නොතිබුණි. | මූල්‍ය ප්‍රතිපාදන ඉක්මණට සලසා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉක්මණින් කටයුතු කරනු ලැබේ. |
| II | පුස්තකාල ගොඩනැගිලි සංකීර්ණය සමඟ සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේ රු.මිලියන 117 ක ඇස්තමේන්තුවක් සඳහා ගිවිසුම් ගත වී තිබුණත්, කාර්යයන් මෙතෙක් නිම වී නොතිබුණි. | සම්පූර්ණයෙන් නිමකිරීමට පියවර ගත යුතු වීම. | කොන්ත්‍රාත් කාර්යයන් නිම වී ඇත. |

**(ආ) තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය | 2015 වර්ෂයේ තිරසාර සංවර්ධන සම්මේලනයේ තීරණයට අනුව කාර්යයන් ක්‍රියාත්මක කිරීම. | 2030 වර්ෂයේ ලඟා කරගත යුතු සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් නිර්ණය කරනු ලබන දර්ශකයන් පිළියෙල කිරීමට පියවර ගෙන ඇත. |

සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා UNOPS ආයතනය විසින් 2017 අප්‍රේල් මාසයේ ගිවිසුම්ගත වූ ආකාරයට එකතු කරනු ලැබූ නොදිරන කසල කොඩුවාමඩු Land fill මධ්‍යස්ථානයට ගෙනයනු ලබන බවත් දිරන කසළවලින් කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන බවත් එකඟ වූ නමුත් මෙයට පටහැනිව ඇතැම් අපද්‍රව්‍ය ගංඉවුරේ බැහැර කරනු ලබන අතර කාබනික පොහොර ද නිෂ්පාදනයක්ද සිදු නොවේ. | සති අන්ත දිනවලද බැහැර කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලවල් යෙදීය යුතු වීම. | වැඩපිළිවෙලවල් සිදුකර ඇත. |

**(ඇ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ රු.මිලියන 32 ක ඇස්තමේන්තුවෙන් රු.13,654,689 ක් වැයකර මධ්‍යම රජයේ සංචාරක කර්මාන්ත අමාත්‍යාංශයෙන් ළමා උද්‍යානයක් ඉදිකර තිබූ නමුත් මෙයට යාබදව කසළ බැහැර කිරීම නිසා වර්ෂ 02 කට අධික කාලයක සිට මෙම ළමා උද්‍යානය මහජනයාට භාවිතා කළ නොහැකි වී තිබුණි. | කාලය අපතේ නොහැර ඉක්මණින් පියවර ගත යුතු වීම. | ඉක්මණින් භාවිතා කිරීමට පියවර ගෙන ඇත. |

**(ඉ) මෙහෙයුම් කාර්යසාධනයේ ප්‍රමාදයන්**

පහත සඳහන් මෙහෙයුම් කාර්යසාධනයේ ප්‍රමාදයන් සිදු වී තිබුණි.

| විස්තරය | ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන | නිමකළ යුතු දිනය | 2018 දෙසැම්බර් 31 දිනට වියදම රු.මිලියන | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|
| වෙළඳපොල ගොඩනැගිල්ල | 193 | 2017 ජුනි | 51 | මූල්‍ය ප්‍රතිපාදන සලසා නොමැත |
| පුස්තකාල ගොඩනැගිල්ල සහ සංස්කෘතික මධ්‍යස්ථානය | 117 | 2016 දෙසැම්බර් | 17.45 | මූල්‍ය ප්‍රතිපාදන සලසා නොමැත |

**(ඊ) අතහැර දැමූ මෙහෙයුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2001 වර්ෂයේ ආසන්න වශයෙන් රු.මිලියන 10 ක වියදමින් ඉදිකර අවසන් කළ කඩකාමර 64 කින් සමන්විත ප්‍රධාන මාර්ගයේ පිහිටි වෙළඳ ගොඩනැගිලි සංකීර්ණය මේ දක්වා මහජන භාවිතය සඳහා විවෘත කර කුලී ආදායම් කිසිවක් ලැබීමකින් තොරව වසා දමා තිබූ බව නිරීක්ෂණය විය. | අධිකරණ තීන්දුව ලබා දුන් විගස පියවර ගත යුතු වීම. | අධිකරණයේ විභාග වෙමින් පවතී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුන්නෙකුකුඩා මාර්ගයේ පිහිටි ආගමික ස්ථාන දෙකකට අයත් ඉඩම් වර්ෂ 33 ක දීර්ඝකාලීන බදු සඳහා ලබාගෙන රු.මිලියන 193 ක ඇස්තමේන්තුවකින් වෙළඳපොල ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2016 ඔක්තෝබර් මස ගිවිසුම්වලට එළැඹ එම දිනයේ සිට රු.56,000 ක මාසික කුලියක් ගෙවා තිබුණි. වෙළඳපොල | ඉතා ඉක්මණින් මූල්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතුයි. නොඑසේ නම් මාසිකව රු.56,250 ක ආදායම් අහිමි වේ. | මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කරනු ඇත. |

ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම් කටයුතු නිම නොවී තිබූ බැවින් ඉඩම් කුලී 2016 ඔක්තෝබර් මාසයේ සිට කිසිදු ආදායමක් උපයා ගැනීමකින් තොරව එම ආගමික ස්ථානවලට ගෙවමින් තිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයින් 14 දෙනෙකු අතිරික්තව පැවැතුණි. | සුදුසු වෙනත් ක්‍රියාමාර්ගයන් ස්ථාපිත කළ යුතු වීම. | දින 180 ක් රාජකාරී ඉටු කළ සේවකයින් 40 දෙනෙකු ස්ථිර සංඛ්‍යාව සමඟ එකතු කර ඇත. |
| (ආ) | සේවක ණය | | |
| | වර්ෂ දෙකකට අධික කාලයක සිට සේවය හැර ගිය, ස්ථාන මාරු වී ගිය පුද්ගලයින් 04 දෙනෙකුගෙන් රු.98,750 ක් අය නොකර හිඟ හිටව පැවතුණි. | ඉතා ඉක්මණින් පියවර ගත යුතු වීම නැතහොත් ඇපකරුවන්ගෙන් අයකර ගත යුතු වීම. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභා බල ප්‍රදේශයට අයත් සියළුම දේපල වාර්ෂිකව නැවත තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී ක්‍රියාමාර්ග ගැනීමට අතපසු නොකළ යුතු වීම. | 2019 වර්ෂයේදී පියවර ගෙන ඇත. |
| (ආ) | පැරණි කඩකාමර කුලියට ලබාදුන් අයගෙන් එකතුව 39 දෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු.5,018,060 ක් අයකර නොගෙන හිඟහිටව පැවතුණි. 2011 වර්ෂයේදී හිඟ හිටව පැවති නමුත් ඒවා අය නොකර අඛණ්ඩව අනෙකුත් ඉදිරි වර්ෂ | | |

දක්වා 2016 වන විටත් ඔවුන්ටම ලබා දී තිබූ බැවින් පැරණි හිඟ ශේෂ අයකරගෙන නොතිබුණි. තවද, ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.5 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා නොතිබුණි. තවද, පුස්තකාල සඳහා වර්ෂ කිහිපයක සිට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ක්‍රියාමාර්ග වේගවත් කළ යුතුවීම. | ක්‍රියාමාර්ග ගනු ලබමින් පවතී. |

**3.5.1 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ පවතින වාහන 09 ක් සඳහා වාහන ලියාපදිංචි කිරීමේ සහතික පොත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පනතේ විධිවිධාන ප්‍රකාරව, ලබාගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ග වේගවත් කළ යුතුවීම. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කරුමාරියම්මන් කෝවිල් මාර්ගයේ කානු ඉදිකිරීම් කර්මාන්තය සඳහා 2015 වර්ෂයේ සිට අදියර 05 කින් රු.8,324,190 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත් නෙල්සිප් විසින් පළාත් සභාව සඳහා ප්‍රතිපාදිත පරිත්‍යාග, මධ්‍යම රජයේ මූල්‍ය ප්‍රතිපාදනවලින් ප්‍රතිපාදන සලසාගෙන රු.9,048,855 ක් වැයකර තිබූ නමුත් කාර්යයන් මෙතෙක් සම්පූර්ණයෙන් අවසන් වී | නිවැරදි ආකාරයෙන් ඇස්තමේන්තු සකස් කර ක්‍රියාමාර්ග ගත යුතු වීම. | නොවැළැක්විය හැකි අවස්ථා හා ප්‍රමාණවත් නොවන මූල්‍ය තත්ත්වය |

නොතිබුණි. තවද, මෙම කාර්යය සඳහා එක් ඇස්තමේන්තුවක් සකස් නොකර ඇස්තමේන්තු 05 ක් සකස් කර ගිවිසුම් 05 ක් මඟින් වෙන් වෙන්ම ලබා දී තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා වාර්තා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඒරාවූර් නගර සභාවේ 2017 වර්ෂයේ පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා කමිටු වාර්තාවේ සඳහන් කර තිබූ කරුණුවලට මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා වාර්තාවට ඉක්මනින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ඉක්මනින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ නිවාස, කඩ කාමර, ඉඩම් ආදිය සඳහා වරිපනම් ඇස්තමේන්තු අගයන් සාමාන්‍යයෙන් 50% ක ප්‍රතිශතයක් පමණක් අයකර ගෙන තිබුණි. හිඟහිටි ප්‍රමාණයෙන් සියයට 53 ක ප්‍රමාණයක් පමණක් අයකරගෙන තිබීම අයවැය ඵලදායී පාලන කාරකයක් වශයෙන් භාවිතා කර නොතිබූ බව අනාවරණය විය. | නිවැරදි ඇස්තමේන්තු මත අයවැය පිළියෙල කළ යුතු වේ. තවද, පසුගිය වර්ෂවල ආදායම් හා වියදම් ද සැලකිල්ලට ගත යුතු වීම. | ඉක්මනින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**4.3 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | කමිටු වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |

**4.4 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කිසිඳු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | අනුපිළිවෙලින් විගණන කමිටු රැස්වීම් පවත්වා ගැටළු සඳහා පිළියම් යෙදිය යුතු වේ. | දැන් ක්‍රියාත්මක වේ. |

**5 පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අනාගතයේදී කටයුතු කරනු ඇත. |
| (ආ) | අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය කාලයේ තථ්‍ය වියදම් අවධානයට යොමු කළ යුතුය. | අනාගතයේදී කටයුතු කරනු ඇත. |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම<br>(ii) සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීමට කටයුතු කිරීම. | අනාගතයේදී කටයුතු කරනු ඇත. |